# 71 වන එක්සත් ජාතීන්ගේ සංවත්සරය

# විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා විසින් කරන ලද කථාව

## 2016 ඔක්තෝබර් 24

එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ශ්‍රී ලංකා නියෝජිත උනා මැකෝලි මැතිණියනි,

එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ කාර්ය මණ්ඩල මහත්ම මහත්මියනි,

එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සාමාජික සාමාජිකාවනි,

නෝනාවරුනි මහත්වරුනි,

ජගත් සංවිධානයේ 71 වන සංවත්සරය සමරනුවස් අද ඔබගේ කාර්යාලයට මෙසේ රැස්ව සිටින සියලු දෙනා හා සමග එකතුවීමට ලැබීම මාගේ ඉමහත් සතුටට හේතු වේ. ජගත් සංවිධානයට වසර 71ක් සපිරෙන මේ මොහොතේ එය ශ්‍රී ලංකාව සමග ඇතිකර ගත් නිල සබඳතාවල 61 වැනි වසර වනු ඇත.

විනාශකාරී ලෝක යුද්ධ දෙකින් අනතුරුව, 1945 ජූනි 26 වැනි දින ජාත්‍යන්තර ප්‍රජා සාමාජිකයින් ශාන්ත ෆ්‍රැන්සිස්කෝ හිදී රැස් වී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අත්සන් තැබීය. 1945 ඔක්තෝබර් 24 වැනි දින බලාත්මක වුණු එම ප්‍රඥප්තියෙන් දෙනු ලැබූ පොරොන්දුව වූයේ, අද අප විසින් සමරනු ලබන හා යළි සලකා බැලිය යුතු වන, යුද්ධයේ පීඩාවන්ගෙන් අනාගත පරපුර බේරා ගැනීමට මෙන්ම ගැටුම් ඇතිකර ගැනීම වෙනුවට සංවාදය, රාජ්‍ය තාන්ත්‍රිකභාවය, ජාත්‍යන්තර සහයෝගීතාව සහ ජාත්‍යන්තර නීතිමත පදනම් වූ පර්යායක් වෙනුවෙන් ඇති පිළිගැනීම වැඩි කිරීම වේ.

පසුගිය 71 වසර පුරාවටම අප ලබාගත් බොහෝ ජයග්‍රහණ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය අපට උපකාර කර ඇත. මනුෂ්‍ය වර්ගයාට මුහුණ පාන්නට සිදු වූ බරපතල ගැටළුවලට අවධානය යොමු කරවීමේ දී, දහස් ගණන් ජනතාව දුගී බවෙන් මුදවා ගැනීමේ දී, ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීමේ දී, කුඩා දරුවන් වෙනුවෙන් ආරක්ෂාව තහවුරු කිරීමේ දී, ලෝකය පුරා විවිධ ප්‍රජාවන් එකිනෙකාට සමීප කරමින්, ශක්තිමත් බැඳීම් ගොඩනැගීමේ දී මෙන්ම නව සබඳතා ඇති කිරීමේදීත් ජගත් සංවිධානය පෙරමුණේ පසුවිය.

එතකුදු වුවත්, අප හමුවේ ඇති අභියෝග බිය උපදවන සුළුය. දේශගුණික විපර්යාස, අර්බුද, සරණාගතයින්, දරුණු අන්තවාදය හා අසහනකාරීබව, මානව

හිමිකම්වලට ඇති තර්ජන, ත්‍රස්තවාදය ආදී තවත් බොහෝ බලපෑම් සැලකියයුතු තර්ජන එල්ල කරනු ලබයි.

කෙසේ වෙතත් අද ලෝකය හමුවේ ඇති ගැටළුවලට පිළියම් සොයා ගත හැක්කේ, එය කෙතරම් අසීරු වේ දැයි හෝ කෙතරම් දුරකට අභියෝගාත්මක වේ දැයි යන කරුණ නොසළකා, එක්සත් ජාතීගේ සංවිධානය පිහිටුවනු ලැබූ හර පද්ධතීන් වූ, බහුවිධතාව, මානව අයිතිවාසිකම්, විවිධත්වයට ගරු කිරීම සහ සාමූහිකව කටයුතු කිරීමේ ප්‍රතිපත්තිය මත පිහිටා කටයුතු කිරීමෙන් පමණක් බව මා තරයේ විශ්වාස කරමි. අපගේ ලෝකය ඉතා කුඩා එකක් බවත්, මිනිසුන් ලෙස අප සැමගේ දෛවයන් එකිනෙකට වෙලී පවතින බවත් විවිධත්වයට ගරු කරමින් ඒ බව අවබෝධ කොටගෙන ජීවත්වීම තුළින් අප සියලු දෙනා එකම මිනිස් පවුලකට අයත් වන බැව් ජනතාවට අවබෝධ කරවීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය තව තවත් නායකත්වය සැපයිය යුතු වෙයි.

නෝනාවරුනි, මහත්වරුනි,

ශ්‍රී ලංකාව තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්ය භාරය අප රජයේ ඇගයීමට ලක් වෙයි. මහලේකම් අතිගරු බැන්-කී-මූන් මහතා මේ වසරේ අප රටට පැමිණීම පිළිබඳව අප ඉමහත් සතුටට පත්වන අතර එය ශ්‍රී ලාංකික ජනතාවට කරන ලද ගෞරවයක් ලෙස අපි දනිමු.

අප රටට ඉතා වැදගත් අවස්ථාවක ඔබ සියලුදෙනා ලබාදෙන සහාය ඉතා අගය කළ යුතුය, අපගේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, සංහිදියාව ඇති කිරීම, සාධාරණ හා සර්වග්‍රාහී ආර්ථික සංවර්ධනයක් සහ තිරසාර සාමයක් උදාකර ගැනීම යන ඉලක්ක සපුරා ගැනීමට අපට වැදගත්වන සෑම ක්ෂේත්‍රයකදීම ඔබ දක්වනු ලබන කැපවීම හා ලබාදෙන උපකාරය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සියලු දෙනාට මා ස්තූතිවන්ත වෙමි.

ඔබ සියලු දෙනාටම මාගේ ස්තූතිය පුද කරන අතරතුර, ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව තහවුරු කිරීමට, සංවර්ධනය උදාකර ගැනීමට, ලෙඩ රෝග මර්දනයට, දුගීබව තුරන් කිරීමට හා සියලු ලෝකවාසීන් වෙනුවෙන් සුවබර හෙටක් උදාකර දීමේ අපේක්ෂාවෙන් වඩා සවිමත් එක්සත් ජාතීන්ගේ සංවිධානයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරන එක්සත් ජාතීන්ගේ සාම සාධක නිලධාරීන් ඇතුලු ලෝකය පුරා විවිධ කටයුතුවල නියැලෙන එක්සත් ජාතීන්ගේ පවුල වෙත මාගේ ප්‍රශංසනීය කෘතවේදීතාව පුද කිරීමට ද කැමැත්තෙමි.

ස්තූතියි.

***